අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ
චක්‍රලේඛ අංකය 13/.1995

මගේ අංකය 4/සාප40/ගුවැප්‍ර/9 ඒ
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
1995.05.11 දින.

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
සියලුම ජාතික පාසල් දෙපාර්තමේන්තු - ප්‍රධාන ගණකාධිකාරීවරුන් වෙත,

## දුෂ්කර දීමනාව ගෙවීම තාවකාලිකව අත්හිටුවීම

ශ්‍රී ලංකා ගුරු සෙවයට අදාළ වැටුප් ක්‍රම 1995.01.01 දින සිට වලංගු වන පරිදි ක්‍රියාත්මක කිරීමක් සමග සියලුම ගුරු භවතුන්ගේ වැටුප් වැඩිවනු ඇත. මේ තත්ත්වය මත 1995.01.01 දින සිට 1995.05.31 දක්වා කාලයට අදාළ, වැටුප් පියවරෙහි තැබීමට හා හිඟ වැටුප් ගෙවීමට විශාල මුදලක් අවශ්‍ය වනු ඇත. එම නිසා තාවකාලික පියවරක් වශයෙන්, 1995.05.01 දින සිට ඉදිරියට වැටුපෙන් 10% ක් හෝ 15% ක් වන දුෂ්කර දීමනාව ගෙවීම තාවකාලිකව අත්හිටුවන්න.

01 අති දුෂ්කර පාසල් හා දුෂ්කර පාසල් පිළිබඳ නිර්නායකයන් නැවත සලකා බලා, සුදුසු තීරණයක් ගන්නා තෙක් මෙම තාවකාලික අත් හිටුවීම ක්‍රියාත්මක වේ. 1995.01.01 දින සිට 1995.04.30 දක්වා කාලයට අදාළව වැටුපෙන් 10%ක් හෝ 15% ක දුෂ්කර දීමනා වශයෙන් දැනටමත් ගෙවා ඇති අතර, එම මුදල ආපසු අය කිරීම අවශ්‍ය නොවේ.

03 ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය නොකරන, ශ්‍රී ලංකා විදුහල්පති ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන්ට පමණක් වැටුපෙන් 10% ක් හෝ 15% ක් වන දුෂ්කර දීමනාව, දැනට, දිගටම ගෙවන්න. ශ්‍රී ලංකා ගුරු සේවයේ වැටුප් ක්‍රම ලබා දෙමින්, ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන, තාවකාලිකව විදුහල්පති තනතුරේ රාජකාරී ඉටු කරන, කාර්‍ය්‍ය නියුක්ත විදුහල්පතිවරුන්ට, වැඩ බලන විදුහල්පතිවරුන්ට, රාජකාරී ආවරණය කරන විදුහල්පතිවරුන්ට, දුෂ්කර දීමනාව නොගෙවන්න. ඔවුන් ද ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරන බැවිනි.

04 දුෂ්කර දීමනාව ගෙවීම පිළිබඳ විධිමත් උපදෙස් ඉක්මනින් නිකුත් කරන බව ද කරුණාවෙන් සලකන්න.

(සේනානායක උපසේන)
අතිරේක ලේකම් (පාලන)

අත්සන් කළේ කේ. අයි. වික්‍රමසිංහ
වැඩ බලන ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත් :-
සියලුම නි.අ.අ. වරුන්

ම/03